# ක්‍රීඩා කොරෙයා සම්මාන 2024

## හැඳින්වීම

ගාමණී කොරෙයා පදනම විසින් 2023 වසරේ ක්‍රීඩා කොරෙයා සම්මාන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ ආචාර්ය ගාමණී කොරෙයාගේ මව වන ක්‍රීඩා කොරෙයා මහත්මිය අනුස්මරණය කරමිනි. එම ව්‍යාපෘතියේ තේමාව වී ඇත්තේ, **කාන්තාවන් සවිබලගැන්වීම** යි. එහි අරමුණ වන්නේ ගැටලු, බාධක සහ අභියෝග පිටුදකිමින් ඵලදායි අයුරින් දිළිඳුකම පරාජය කිරීමට සමත් වූ කාන්තාවන්ට සම්මාන පිරිනැමීමයි.

රටේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා මෙරට සියලුම පුරවැසියන් දායකත්වය සැපැයීම තීරණාත්මක සාධකයක් බවට පත් වී ඇත. එම සංදර්භය තුළ කාන්තාවගේ භූමිකාව අතිශය වැදගත් ය. කෙසේ වුවද මෙරට ශ්‍රම බළකායට කාන්තාවගේ දායකත්වය 33% ක් පමණක් වන අතර, ගෘහ ජීවිතයේ කාන්තා මූලිකත්වය ඉහළ යමින් පවතී. එම නිසා සිය පවුල නඩත්තු කිරීම, දරුවන් රැකබලා ගැනීම ආදී ගෘහ ජීවිතයේ සියලු රාජකාරීවල බර උසුලනු ලබන්නේ කාන්තාවන් විසිනි. කාලය පිළිබඳ ගැටලු සහ අනිකුත් සාධක හේතුවෙන් රටේ සංවර්ධනය ප්‍රයත්නයට ඉවහල් විය හැකි තිබූ ඔවුන්ගේ සැඟවුණු කුසලතා ඵල රහිත වී තිබේ.

ක්‍රීඩා කොරෙයා සම්මාන 2023 පවත්වනු ලැබුවේ පර්යේෂණ දත්ත පදනම් කැර ගත් තරගයක් ලෙසිනි. මෙමඟින්, රටේ ආර්ථික සංවර්ධනයට හරවත් දායකත්වයක් ලබා දීමට හැකි අලුත් මානයන් සහ අවස්ථා විවර කැර ගැනීමට හැකිය.

**අදියර II- ප්‍රීඩා කොරෙයා සම්මාන 2024**

ප්‍රීඩා කොරෙයා සම්මාන උලෙළ 2024 පවත්වනු ලබන්නේ, 2023 සම්මාන උලෙළ පැවැත් වූ ස්වරූපයෙන්මය. පළමු අදියර තුළින් ලැබුණු තොරතුරු අනුව දිළිඳු සහ මධ්‍යම ආදායම් ලාභී කාන්තාවන්ගේ ප්‍රශ්නවලට නිසි විසඳුම්ක් ලැබී නැති බව පැහැදිලිය.එබැවින් **අදියර II යටතේ ග්‍රාමීය කාන්තාවන්ගේ ව්‍යාපෘති දියුණු කිරීම සඳහා ඔවුන්ගේ ප්‍රදේශයේ දැනුවත් අයගේ අදහස්,විසඳුම් සහ උපායමාර්ග කතා රචකයන් ඔවුන්ගේ කතාවලට ඇතුළත් කළ යුතුය.මෙම කාන්තාවන්ට ඉදිරි අනාගතයට මුහුණ දීම සඳහාත්, බලගැන්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහාත්, මෙම තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්ට ලබා දීමට නියමිතව ඇත.**

**සංකල්පය -**

**ලේඛක ලේඛිකාවන් සඳහා තරගයක් :**

කාන්තාවන් සිය පවුලේ ජීවන තත්ත්වය නඟා සිටුවන අතරතුර රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වයක් ලබා දෙන බව සත්‍යයකි.

කතා රචකයන් දිරිය කාන්තාවන් සහ ප්‍රජා මූලික කාන්තා ව්‍යාපෘති හඳුනා ගෙන ඔවුන් සමඟ සාකච්ඡා කැර එමඟින් තොරතුරු ලබා ගත යුතුය. විශේෂයෙන්, ඔවුන් මුහුණ දුන් අභියෝග, බාධක , ගැටලු සහ ඒවා මැඩපැවත්වූ ආකාරය මෙන්ම ව්‍යාපෘතිය ඉදිරියට රැගෙන යා යුතු ආකාරය ගැන ඔවුන්ගේ විසඳුම් සහ යෝජනාවන් ද කතාවට පාදක විය යුතුව තිබේ.

<u>තේමාව - දිරිය කාන්තාවෝ -</u>

ප්‍රීඩා කොරෙයා සම්මාන 2024 පළාත් මට්ටමින් පවත්වනු ලැබේ.

**ලේඛක ලේඛිකාවන් ලෙස සුදුසුකම් -**

01. වයසස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා මෙම තරගය විවෘත ය. එසේම විශ්‍රාමික ලේඛකයන්ට ද මෙම තරගය විවෘත වෙයි.

02. ලේඛක ලේඛිකාවන්ට සිය කතාව ඕනෑම පළාතකින් ඉදිරිපත් කළ හැකිය.

03. එම කතාව ඉහත සඳහන් පරිදි තරගයේ අවශ්‍යතාවන්ට අනුගතව ඉදිරිපත් කළ යුතුය.

04. එක් දිරිය කාන්තාවක් පිළිබඳ ඉදිරිපත් කළ හැකි වන්නේ එක් කතාවක් පමණි.

**ඉලක්කගත කණ්ඩායම -**

සිය පවුලේ ජීවන තත්ත්වය නංවාලන අතර , රටේ ආර්ථික සංවර්ධනයට දායක වන අඩු සහ මධ්‍යම පාන්තික ආදායම්ලාභී කාන්තාවන් / ප්‍රජා මූලික කේන්ද්‍රීය කාන්තා කාණ්ඩයම් මෙයට අයත් වෙයි.

**කතා කාණ්ඩ -**

ලේඛක - ලේඛිකාවන් සෙසු අයට දිරිගැන්වීමක් ගෙන දෙන ආකාරයේ සාර්ථකත්වයක් ලැබූ කාන්තාවන්ගේ ව්‍යාපෘති හඳුනාගත යුතුය.

පහත සඳහන් කාණ්ඩ යටතේ කතා රචකයන්ට කතා ඉදිරිපත් කළ හැකිය .

1. පවුල් විමුක්තිය
2. ව්‍යවසායකත්වය ( සුළු හා මධ්‍ය පරිමාණ )
3. සුවිශේෂී ජයග්‍රහණ

**පවුල් විමුක්තිය -**

දරාගත නොහැකි ප්‍රශ්න සහ අභියෝග මැද ජීවිතය ජයගත් ගෘහනියන් මෙම කාණ්ඩයට අයත් වෙයි.

**ව්‍යවසායකත්වය -**

සිය නිර්මාණශීලීත්වයෙන් සහ අධිෂ්ඨානයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් සැලකිය යුතු සාර්ථකත්වයක් ළඟා කැරගත් කාන්තාවන් / ප්‍රජා මූලික කාන්තා ව්‍යාපෘතියක් මෙහෙය වන කාන්තාවන් මෙම කණ්ඩයට අයත් වෙයි. එසේම අවම ප්‍රාග්ධනයක් භාවිතා කරමින්, නිෂ්පාදන සංවර්ධනය, ව්‍යාපාර දැනුම, රැකියා උත්පාදනය, විදේශ විනිම ආදායම, පරිසර හිතකාමීත්වය සහ නව්‍යතාවය අතින් සැලකිය යුතු දියුණුවක් ළගා කැර ගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායිකාවන් ද මෙම කාණ්ඩයට ඇතුළත් වෙයි.

**සුවිශේෂී ජයග්‍රහණ -**

මෙම කාණ්ඩයට ඇතුළත් වන්නේ, දේශීය හෝ ජාත්‍යන්තර පිළිගැනීම තුළින් කීර්තියක් දිනා ගත් කාන්තාවන්ය. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු විය යුතු වන්නේ, බාධක, ගැටලු සහ අභියෝග ජය ගනිමින්,විද්‍යාව, තාක්ෂණය. ක්‍රීඩාව, කලාව, ආරක්ෂක ක්‍රම , අධ්‍යාපනය හෝ වෙනත් සුවිශේෂී ක්ෂේත්‍රයක් තුළින් දස්කම් දැක්වූ දිරිය කාන්තාවන් වීම විශේෂත්වයකි.

**ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය -**

ලේඛක - ලේඛිකාවන්ට, පහත සඳහන් ආකාරයෙන් තරගය සඳහා ලියාපදිංචි වීමට ආරාධනා කරමු.

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරනු ලැබූ පුවත්පත් දැන්වීම් මගින්.
2. ලේඛක - ලේඛිකාවන්ට ආරාධනා කරමින් විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතන වෙත යොමු කරනු ලැබූ මුද්‍රිත පෝස්ටර් මගින්.
3. මුහුණු පොතේ (Facebook) දැන්වීම් මගින්.
4. සිංහල සහ දෙමළ භාෂාවෙන් පවත්වනු ලබන රූපවාහිනී සම්මුඛ සාකච්ඡා දෙකක් මගින්.

මෙම තරගයට සහභාගි වීමේ අවශ්‍යතාව සහිත අයැදුම්කරුවන් 2024 ජූලි මස 28 වැනිදා සිළුමිණ , සන්ඩේ ටයිම්ස්,වීරකේසරී පුවත්පත්වල ප්‍රකාශයට පත් කරනු ලැබූ දැන්වීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- දිරිය කාන්තාවන් හඳුනා ගැනීමෙන් පසු එම කතාව තරගයට ඇතුළත්වීමට සුදුසුකම් ලබන්නේ දැයි යන්න තීරණය කිරීම සඳහා ලේඛික - ලේඛිකාවන් තෝරාගත් කතාවෙහි සාරංශයක් (Word සහ PDF මුහුණුවර යටතේ එක් A4 පිටුවක්) ලියා එවිය යුතුය.

- අයැදුම්කරුවන් සිය අයැදුම්පත එවීමේදී font 12 ප්‍රමාණයේ අකුරු භාවිත කළ යුතුය. (ඉංග්‍රීසි භාෂාව සඳහා Times New Roman ද, සිංහල භාෂාව සඳහා ඉස්කෝල පොත (Iscola potha) ද, දෙමළ භාෂාව සඳහා Bamini ද භාවිත කරමින් Word සහ PDF මුහුණුවර යටතේ එවිය යුතුය.)

- අත්අකුරින් එවනු ලබන අයැදුම්පත් කිසිවක් බාර ගනු නොලැබේ.

- සිංහල සහ දෙමළ අයැදුම්පත් යුනිකෝඩ් ආකාරයෙන් එවිය යුතුය.

**<u>අවසන් කතා තේරීම</u>**

- ලේඛක - ලේඛිකාවන් විසින් එවනු ලබන කතා සාරංශ කෙටි ලැයිස්තු ගත කොට තෝරා ගන්නා අතර, ඔවුන්ගේ අවසන් කතාව තරගයට ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබේ.
- ව්‍යාපෘතිය තවදුරටත් දියුණු කිරීම සඳහා කතා රචකයන් තමන්ගේ අදහස් ඊට ඇතුළත් කළ යුතුය .

- ව්‍යාපෘතිය අධ්‍යයනය කිරීමෙන් පසු ලබාගත් තොරතුරු ලේඛක - ලේඛිකාවන් ගාමණී කොරෙයා පදනම ලබා දෙන දත්ත පත්‍රිකාවට ඇතුළත් කළ යුතුය.
- ලේඛක - ලේඛිකාවන් තොරතුරු එක්රැස් කළ යුතු වන්නේ කතාවේ හිමිකාරිනියන් සහ සෙසු පාර්ශ්වකරුවන් සමඟ මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගිනි.
- ශ්‍රීඩා කොරෙයා සම්මාන 2023 තරගයේදී පළමු, දෙවැනි හා තෙවැනි ත්‍යාග හිමි කැරගත් දිරිය කාන්තාවට ශ්‍රීඩා කොරෙයා සම්මාන 2024 තරගයට සහභාගි විය නොහැකිය.

**සම්මාන -**

දිරිය කාන්තාවන්ට /ප්‍රජා මූලික ව්‍යාපෘතිවලට සහ කතා රචකයන්ට ශ්‍රීඩා කොරෙයා සම්මාන 2024 මගින් ආකර්ශනීය ත්‍යාග පිරිනමනු ලැබේ.

සෑම පළාතකින්ම පළමු, දෙවැනි හා තෙවැනි ස්ථාන ලබා ගන්නා

ලේඛක - ලේඛිකාවන්ට සහ සම්මානලාභීනියන්ට ත්‍යාග පිරිනමනු ලබන්නේ

පහත සඳහන් අයුරිනි.

<table>
<tr><th colspan="2">සම්මානලාභිනිය</th><th colspan="2">ලේඛක ලේඛිකාව</th><th>පළාත</th></tr>
<tr><td>1 ත්‍යාගය</td><td>රු.400,000</td><td>1 ත්‍යාගය</td><td>රු. 200,000</td><td rowspan="3">1.බස්නාහිර<br>2.මධ්‍යම<br>3.දකුණු<br>4.උතුර<br>5.නැගෙනහිර<br>6.වයඹ<br>7.උතුරුමැද<br>8. සබරගමුව<br>9.ඌව</td></tr>
<tr><td>2 ත්‍යාගය</td><td>රු.200,000</td><td>2 ත්‍යාගය</td><td>රු. 100,000</td></tr>
<tr><td>3 ත්‍යාගය</td><td>රු. 100,000</td><td>3 ත්‍යාගය</td><td>රු. 50,000</td></tr>
</table>

**නියාමන සහ කොන්දේසි -**

1.සිංහල , ඉංග්‍රීසි හෝ දෙමළ භාෂාවලින් කතා ඉදිරිපත් කළ හැකිය.

2. ඉදිරිපත් කරනු ලබන සියලුම කතා ලේඛක - ලේඛිකාවන්ගේ මුල් කෘතියක් විය යුතුය.

3.ලේඛක - ලේඛිකාවන් කතාවේ අයිතිකරුගෙන් කතාව ලිවීමට සහ ඉදිරිපත් කිරීමට අවසර ගත යුතුය. එසේ ම කතාවේ අයිතිකරු කතාවේ අඩංගුවන කරුණු අනුමත කළ යුතුය.

4 තොරතුරු සහ ව්‍යාපෘතිවල සත්‍යතාව තහවුරු කිරීම ට ගාමණී කොරෙයා පදනමේ කණ්ඩායමක් පැමිණෙනු ඇත.

5. කතා ඇගැයීම් කමිටුවක් විසින් ලබා දෙන ලකුණු මත පදනම් වූ ක්‍රමවේදයක් අනුව විනිශ්චය සිදු කෙරේ.

6. ජයග්‍රාහකයන් පිළිබඳ ඇගැයීම් කමිටුව විසින් ගන්නා තීරණ අවසන් තීරණය වන අතර, ඊට අභියෝග කළ නොහැකිය.

7. මෙම කාර්යයෙහිදි කිසිවකුට සිදුවන අලාභ හෝ පාඩු සම්බන්ධයෙන් ගාමනී කොරෙයා පදනම වග කියනු නොලැබේ.

8. කතාවල සත්‍යතාව පිළිබඳව ස්වාධීනව පසුබිම් පරීක්ෂණයක් සිදු කරණු ලැබේ.

**අවසන් කතා සඳහා පහත සඳහන් අවශ්‍යතා අනුගමනය කළ යුතුය.** (සියලුම භාෂා සඳහා)

• වචන 1500- 2000 අතර විය යුතුය.

• ලේඛක ලේඛිකාවන්ට සිය කතාව ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කළ හැකිය.

• Word සහ PDF මුහුණුවර යටතේ font 12 අකුරු ප්‍රමාණයෙන් කතාව ඉදිරිපත් කළ යුතුය.

• නිවැරැදි ලෙස නිර්වචනය කළ ආරම්භයක්, ක්‍රමවත් මැද කොටසක් සහ අවසානයක් තිබිය යුතුය.

• පහසුවෙන් අවබෝධ කරගත හැකිවන පරිදි පැහැදිලි නිවැරදි භාෂාවකින් ලිවිය යුතුය.

• සෑම වාක්‍යයක්ම පේළි තුනකට වඩා දිගු නොවිය යුතුය.

• කතාව කේන්ද්‍ර විය යුතු වන්නේ, එක් දිරිය කාන්තාවක් හෝ ප්‍රජා මූලික ව්‍යාපෘතියක් මත පමණි.

• කතාව ලිවීමේදී ලේඛක - ලේඛිකාවන්ට එකක්, දෙකක් හෝ තුනම තෝරාගත හැකිය.

• ලේඛක - ලේඛිකාවන්ට එක් එක් කාණ්ඩය තුළ කතා එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලිවිය හැකිය.

• එම කතාවේ හිමිකාරිනිය තහවුරු කරනු ලබන කරුණු මත සියලු කතා පදනම් විය යුතුය.

**<u>ලේඛක - ලේඛිකාවක ලෙස ලියාපදිංචි වීම -</u>**

කරුණාකර ලබා දී ඇති පෝරමය පුරවා පහත සඳහාන් විද්‍යුත් ලිපිනයන්ට යොමු කරන්න.

shiraneemanagerfca@gmail.com ( ජංගම දුරකතනය - 0743622324)

chandanacoordinatorfca@gmail.com (ජංගම දුරකතනය-0773994867)

amcerm.gcf@gmail.com ( ජංගම දුරකතනය- 0771589484)

**නොඑසේ නම් ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට යොමු කරන්න.**

Shiranee Dissanayake

Consultant

Gamani Corea Foundation

21, Horton Place

Colombo 7

ඇතුළත්වීමේ අංකය. (ජා.හැ.අංක). . . . . . . . . . . . . ..

**ෆ්‍රීඩා කොරෙයා සම්මාන 2024**

**ලේඛක - ලේඛිකාවන් සඳහා ලියාපදිංචි වීමේ අයැදුම්පත**

ඉහත තරඟය සඳහා ලේඛක - ලේඛිකාවක ලෙස ලියාපදිංචි වීමට මා බලාපොරොත්තු වන අතර, අවශ්‍ය පරිදි මගේ විස්තර මේ සමඟ ඉදිරිපත් කරමි.

ලේඛක ලේඛිකාවගේ නම:

තැපැල් ලිපිනය:

විද්‍යුත් ලිපිනය:

දුරකතන අංක.

ජාතික හැඳුනුම්පත /ගුවන්ගමන් බලපත්‍රයේ ඡායාරූප පිටපතක් කරුණාකර අමුණන්න.

පළාත:

දිස්ත්‍රික්කය:

---------------------------------------------------------------------------------

අනාගත සම්මානලාභිනියගේ නම:

තැපැල් ලිපිනය:

විද්‍යුත් ලිපිනය:

දුරකතන අංක.

ජාතික හැඳුනුම්පත /ගුවන්ගමන් බලපත්‍රයේ අංකය ඡායාරූප පිටපතක් කරුණාකර අමුණන්න.

පළාත:

දිස්ත්‍රික්කය:

ග්‍රාම නිලධාරී කොට්ඨාසය:

**<u>කතා සාරාංශය</u>**

------------------------------------------ගේ කතාවේ කෙටි සාරාංශයක් මේ සමග අමුණා ඇත.

ක්‍රීඩා කොරෙයා සම්මාන 2024 තරගයට ඇතුළත් විමට සිය කතාව ලියා ඉදිරිපත් කිරීම සඳහා මම මේ සමග---------------------------------------------- (කතාවේ හිමිකාරිනිය),ලිඛිත අනුමැතිය අමුණා.

ලේඛක ලේඛිකාවගේ අත්සන-

දිනය:

අනාගත සම්මානලාභිනියගේ අනුමැතිය :

ජාතික හැඳුනුම්පත අංකය -------------------------------- දරණ නමැති මම ජාතික හැඳුනුම්පත් අංක ------------------------------- . දරණ ............................................................ වෙත ක්‍රීඩා කොරෙයා සම්මාන 2024 සඳහා ඇතුළත්වීමට මාගේ කතාව ලියා ඉදිරිපත් කිරීමට මාගේ අනුමැතිය ලබා දෙමි.

අත්සන-

දිනය:-